# මනු ලොවින් ප්‍රේත ලෝකයට

පාතේගම ඤාණිස්සර හිමි

ප්‍රශ්නය

**ගේ ඇතුගේ සිට මළගිය ඥාතීන්ට පින්පෙත් අනුමෝදන් කිරීම සුදුසුද? එසේ පින් දුන් පසු මළගිය ඥාතින් ගේ ඇතුළෙ රැදෙනවාද?**

පිළිතුර

මේ ප්‍රශ්නය තුළ ගැටලු දෙකක් ඇති බව පෙනෙනවා එනම් මියගිය ඥාතීන් සහ මියගිය ඥාතීන් නොවන අය පිළිබඳවයි ප්‍රශ්නයෙන් විමසන්නේ,

සාමාන්‍යයෙන් අප සමග ජීවත් වී අප අතහැර මියගිය ලේ නෑයන් ඥාතිවරුන් වශයෙන් හඳුන්වනවා යම්කිසි පුද්ගලයෙකු මියගිය පසුව ඔහුගේ නැවත උපත හෙවත් චුතිය ඇතිවන්නේ මරණාසන්න මොහොතේ ඇතිවූ සිතිවිල්ලට අනුවයි යහපත් අනන්තවත් සිතුවිලි අනුව සුගතිගාමි හා දුගතිගාමි ස්ථානවල උපත ලබනවා. එසේ උපත ලබන දුගතිගාමි ස්ථාන අතරට ප්‍රේත කොට්ඨාශ කිහිපයක් ඇතිබව ධර්මයෙන් විග්‍රහකර තිබෙනවා

ප්‍රේතයන් හා ප්‍රේත කොට්ඨාශ පිළිබඳ විග්‍රහ දැකිය හැකිවන්නේ ඛු. නි. තිරොකුඩ්ඩ සූත්‍රයේදීය එම සූත්‍රයේදී මළ ගිය ප්‍රාණකාරයන් කීපදෙනෙකු පිළිබඳවම අවධාරණය කරණු ලබනවා අටුවා ග්‍රන්ථවලට අනුව ප්‍රේත ආත්ම රාශිමක්ම පවතින බව පෙනෙනවා එම ප්‍රේත කොට්ඨාශ සහ එසේ වීමට හේතුත් ඔවුන් මෙලොව ජීවත් වන අය විෂයෙහි කරනු ලබන බලපෑම් පිළිබඳවත් වෙනත් තැනක සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වෙනවා.

අපේ ප්‍රශ්නයට අදාළව පිළිතුරක් ලෙස ගැනීමට පුලුවන් සිද්ධියක් බුද්ධ කාලයේ සිදුවෙලා තිබෙනවා මළගිය ප්‍රේතයන්ට පිං දීම පිළිබඳව සිද්ධියකුයි. ඒක තිරෝකුඩ්ඩ සූත්‍රයේ නිදාන කථාව ලෙස මෙය දක්වන්න පුලුවන්.

රාජමාළිගාවේ මහා දානමය පිංකමක් සංවිධානය කළ බිම්බිසාර මහරජතුමා දන් වළදා අවසන් වූ පසුව බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී හස්තයට පැන් වක් කොට තමා විසින් කරවන ලද වේළුවනාරාමය පූජා කළා බුදුරජාණන් වහන්සේද විහාර ආරාම පූජාකිරීමේ අනුහස් පැහැදිළි කරනු ලැබුවා

එදින රාත්‍රියේ රජතුමා තමන් ඉදිරියේ සිට මහ හඬින් හඬා වැළපෙන ප්‍රේතයන් සමූහයක් දුටුවා පසු දින උදෑසන වේළුවනාරාමයට ගොස් රජතුමා එ බව බුදු හිමියන්ට සැළ කළා එම අඬා වැළපුණ පිරිස අතර පෙර අත්භවයක රජතු-මාගේ නෑයන් බවත් සාංඝික දේපල කෑම නිසා කර ගත් පවින් නරකයේ ඉපිද අනන්ත කාලයක් දුක් විඳ ඉන් චුතව ප්‍රේත යෝනියේ ඉපිද තුන් බුද්ධාන්තරයක් කල් සා පිපාසාවෙන් වෙළී දුක්විඳිනා බවත් ඔවුන් එයින් මිදවීමට ඔවුන්ට පින් අනුමෝදන් කළ යුතු බව දේශනා කළා පසුව මහා දනක් පුදා ප්‍රේයන්ට අනුමෝදන් කෙරෙව්වා එදා රාත්‍රියේ එම පිරිසම බොහෝ සතුටු සහගත ලෙස ප්‍රිතිමත්ව සිටිනු දුටුවත් නිරුවත්වයි සිටියේ රජතුමා තමා දුටු සිහිනයත් බුදුරදුන්ට දැන්වූවා

රෙදිපිළි පූජාකොට ප්‍රේතයන්ට පින් අනුමෝදන් කළ යුතු බව බුදුහිමියන් දේශනා කළා රජතුමා එසේ කළා ප්‍රේතයන් පින් අනුමෝදන් ව යස ඉසුරු ලැබුවා

මේ සිද්ධියෙන් පැහැදිළි වන කරුණු තමයි මළ ගිය ප්‍රේතයන්ට පිං දුන් පසු ඔවුන් තම ආත්ම සුගතිගාමී කරගන්නවා කියන එක අනෙක පින් ගන්නට එන්නේ කුමක් හෝ සසර ලේ නෑ සබඳකමක් තියෙන අය විතරයි

**ගේ ඇතුළේ සිට මියගිය ඥාතීන්ට පින් දීම වරදක් නැති බව මෙයින් පෙනෙනවා පින් අනුමෝදන් වූ පසු ව ඔවුන් එහි රැඳෙන්නේ නැහැ සියලුම මළගිය ප්‍රාණකරුවන් පින් ගන්න එන්නෙත් නැහැ තමන් හා සම්බන්ධයක් තියෙනවානම් පමණයි ඔවුන් එන්නේ මළගිය ප්‍රාණකාරයන් ගැන නොතකා වැඩ කටයුතු කරන අයට නම් යහපතක් වෙන්නේ නෑ එයට හේතුව ප්‍රාණකාරයන්ගේ අපුල් බැල්මයි ඔවුන් ඒ ඒ ස්ථානවල සිටිනවා එවිට ගෘහ ජීවිතය අවුල් වෙනවා අඹු සැමි සබඳකම් පලුදු වෙනවා ව්‍යාපාර පහතට වැටෙනවා පුද්ගලයා ධනයෙන් පිරිහෙනවා එනිසාම මෙලොව ජීවත් වන අයට මළගිය ප්‍රාණකාරයන්ගේ ආශිර්වාදය අවශ්‍යයි යම් යම් පූජා වර්ග ඔවුන්ට කළ යුතුයි පත්තකම්ම සූත්‍රයේ දී "පුබ්බප්‍රේත< බලි යනුවෙන් මෙය හඳුන්වලා තියෙනවා**



ප්‍රශ්නය

**මළගිය ප්‍රේතයන් සියල්ලම උපදින්නේ එකම ආත්මයකද? නැතිනම් ඒවායේ වර්ග කොටස් බෙදීමත් ධර්මයට අනුව පවතිනවාද?**

පිළිතුර

යම් පුද්ගලයකු මියගිය පසු ඔහු ප්‍රේතයෙක් වෙනවාද? දෙවියකු වෙනවාද? මනුෂ්‍යයකු වෙනවාද? සත්වයකු වෙනවාද? කියලා පූර්වයෙන් නිශ්චය කරන්න බැහැ ධර්මයට අනුව නම් පෙනෙන්නේ මේ හැම කෙනෙකුම විය හැකි බවයි

විශේෂයෙන් මළගිය ප්‍රේත ආත්මයක් නොවන බව පැහැදිලියි එහි ආත්ම කිහිපයක් තිබෙනවා, බෞද්ධ සූත්‍ර ධර්මවලට අනුව ආත්ම පහක් දක්වන්න පුලුවන්.

1 **නිජ්ඣාම තණ්හික**
2 **ඛුප්පිපාසික**
3 **පාංශු පිශාචක**
4 **කාලකංජ අසුර**
5 **පරදත්තුපජීවි**

බිල සහිත ගසක ඇතුළත හටගත් ගිනිකඳක් කර්ම තේජසින් ඇතුළත දැවෙන ප්‍රේත කොටසක් ලෙසින් නිජ්ඣාම තණ්හක කොටස හඳුන්වන්න පුලුවන්, ශරිරය නිතර දැවෙන පිච්චෙන කුසගින්නේ දැවෙන කොපමණ ආහාර ගත්තත් කුස පිරිමක් නැති පිරිසක් ලෙස මොවුන් දැක්විය හැකි අතර අනන්ත කාලයක් මෙසේ දුක් විඳිනවා එබඳු ප්‍රේතයන් යම් යම් ස්ථානවලට අරක්ගෙන ඉන්න පුලුවන් ඔවුන් ජීවත් වන්නෙත් මේ ලෝකයේමය යම් යම් අපිරිසිදු ස්ථානවල ගිජ්ඣ පර්වතයේ අසලින් වඩින විට බුදු හිමියන් මෙබඳු ප්‍රේතයෙක් දුටුවා. ශරිරය ඉතා විශාලයි. බඩසයින් දැවෙමින් බොහෝ කාලයක් එම ස්ථානයේ සිටිනවා. බුදුහිමියෝ සිනහා පහල කළා එවිට ආනන්ද හිමි එයට හේතු විමසුවා මේ ප්‍රේතයා අනඳ හිමියන්ට පෙනෙන්න සැලැස්සුවා අපට නොපෙනුනත් ඒ ඒ ස්ථානවල ඔවුන් ඉන්න පුලුවන් අන් සතු දෙයට ලොබ බැඳ ජීවත් වන මිනිසුන්ගේ ඊළඟ ආත්මය දුගතිගාමි වෙනවා. සෙම් සොටු පමණකුදු අහරක් නැතිව කල්ප ගණන්

සා පවසින් පෙළෙමින් දුක් විඳිනා ප්‍රේත කොටස ඛුප්පාසික නම් මෙම ප්‍රේත වර්ගයන් තැන තැන සිටිනවා. මිනිසුන් දිහා බලලා කන බොන අය ගැන සඳහන් වෙනවා. අවුරුදු ගනන් කුසගින්නේ ඉන්නේ කොපමණ වතුර බිව්වත් පවස සංසිඳෙන් නැ කුස පිරෙන්න අහරක් ලැබෙන්නැ බිම වැටී තිබෙන සෙම් සොටු ආහාරයට ගන්නවා මුඛය ළං කරන විට වෙනත් සත්වයෙකු විසින් කා අවසානයි ශරීර අතිශයින්ම විශාල නිසා තමයි මෙබඳු දේවල් සිදුවන්නේ මෙබඳු ප්‍රේතයන් ගැන ප්‍රේතවස්තුවේ විස්තර වෙනවා. ඔවුන් එසේ වීමට කර ඇති අකුසල ධර්ම ගැන පසුව සාකච්ඡා කරන්නට බලාපොරොත්තු වෙනවා.

**කුණු ගොඩවල් වැනි අපවිත්‍ර තැන්වල ආහාර සොයා දුක් විඳිනවා කුණු කන පස් කන ප්‍රේතයන් පාංශු පිශාචක නම් මෙබඳු ප්‍රේතයන් ඉඩකඩම්වලට අරක්ගෙන වුනත් ඉන්න පුලුවන් සමහර ඉඩම් දුටුගමන්ම අන්ධකාර ස්වභාවයක් පෙනෙනවා. පිශාචක ප්‍රේතයන් ඉන්න ඉඩම්වල ආලෝකයක් නැහැ. අඳුරු කුණු කකා එම ඉඩමේම ඉන්නවා. ඉඩම් වලට ආශාවෙන් මැරුණු අය මෙබඳු ප්‍රේතයන් ලෙස ඉපිද කල්ප ගණන් එසේ ජීවත් වෙනවා. මෙම සිද්ධීන් වලට සමහර කුඩා දරුවන් බිය වෙනවා. නිවසේ ඇති කරන බල්ලන් බළලුන් වැනි සත්ත්වයින් ද බියට පත්වෙනවා සමහර විට ඔවුන් ඉබේම මැරෙනවා.**

ප්‍රශ්නය

**මිය පරලොව ගිය ප්‍රාණකාරයන් වෙනුවෙන් කළ යුතු ආගමික චාරිත්‍ර මොනවාද?**

පිළිතුරු

යම් පුද්ගලයෙක් මිය ගිය පසුව දේහය නිවසේ දින ගණනක් තබාගෙන සිට නැකතක් අනුව එළියට ගන්නවා. පසුව මහා සංඝරත්නය වඩමවාගෙන අවුත් මතක වස්ත්‍ර පූජාව කරනවා. දේහය මිහිදන් කරන ස්ථානයට ගෙන ගොස් වළ වටේට තුන් වරක් කරකවනවා. එසේ කරන්නේ ප්‍රාණකාරයන්ට ගෙදරට එන පාර අමතක කරවන්න. මෙය ඕනෑම ප්‍රදේශයකම වාගේ සිදු කෙරෙන චාරිත්‍රයක් එදින රාත්‍රියේ ඉටි පන්දම් හෝ මැටි පහන් පත්තු කර එම ස්ථානය ආලෝකමත් කරනවා.



මළගිය අය අයිති නිවසේ එදින සිට දින හතක් යනතුරු රෑට රෑට වෙස්සන්තර ජාතක කාව්‍යය කියනවා. එසේ කරන්නේ නිවෙස් තුළ පවතින පාළුව මැකී යාම සඳහා, ගමේ ඉතා හොඳින් කවි ගායනය කරන්නට දක්ෂ අය ගමේ මිනිසුන් අතර සමගිය සමාදානය ඇති වන අවස්ථාවක් හැටියට මෙය හඳුන්වන්නට පුළුවන්. මියගිය අයගේ සැමැරුම් කරමින් ම දුකට පත් අයගේ ශෝකය තුනී වන ලෙස කටයුතු කරනවා.

දින හතක් ගත වන දිනයේ රාත්‍රියේ භික්ෂූන් වහන්සේ නමක් ලවා ධර්ම දේශනාවක් කරවනවා එයට කියන්නේ මතක බණ කියලා පිරිකර පූජා කරලා මියගිය ඥාතිවරයාට පින් අනුමෝදන් කරනවා. දහවල ගරුතර මහා සංඝයාට දනක් පූජා කර පිං දෙනවා

බණ කියා රාත්‍රියේ තටුවක් හදලා මිය ගිය අය කන්නට කැමති දෙවලුත් බොන්න කැමති දේවලුත් තියෙනවා එයට කියන්නේ ප්‍රේත ගොට්ට කියලා ඒ අසල සුදු වැලි ඇතිරවීමටත් සමහර ප්‍රදේශවල අය අමතක කරන්නේ නැහැ දවල් දානය වෙලාවේ දී එහෙම කරනවා හත් දවසෙහි තුන් මාසෙන් අවුරුද්දෙන් ආදී වශයෙන්, පුළුවන් ආකාරයට මළගිය ඥාතිවරයා වෙනුවෙන් පින්කම් කර පින් දෙනවා, මළගිය ප්‍රේතයාට තටුව තියන්න කලින් දුම් අල්ලනවා, පහන් පත්තු කරනවා, ගාථාවක් කියා පූජා කරනවා මියගිය ප්‍රේතයාට තටුව පූජා කරන ගාථාව මෙසේයි.

**ගන්ධං දීපංච පානීයං- භොජනං පිච**
**පතිගණ්හාතු සංතුට්ඨ -ඤාතිපේතා ඉදං බලි**

"සුවඳ පහන් දුම් හා ආහාර පාන වර්ග ඥාති ප්‍රේතයෝ සතුටු වී පිළිගනිත්වා! යනු මෙහි තේරුමයි. ඤාතීන් මේ බලිතටුව ලැබෙන තුරු බලා සිටින බව මෙයින් කියවෙනවා සමහර විට හිමි නමක් කියනවා නැත්නම් තේරුම් බේරුම් ඇති දායක මහත්මයෙක් මෙය කියනවා, මෙසේ ප්‍රේත තටුව පූජා කළ, පසු මියගිය අය සුඛිත මුදිත බවට පත්වෙනවා, මේවාත් ඒ ඒ ප්‍රදේශවල පවතින චාරිත්‍ර ලෙස හඳුන්වන්න පුළුවන් බලි තටුවේ යම් යම් අඩු පාඩු සිදු වූ විට ගෙදර යම් යම් කරදර ඇති වන බවත් ගෙදර අය අතර හිත් නොහොඳකම් ඇති වන බවත් ජනයා විශ්වාස කරනවා.

මිය ගිය අය ගෙදර බලා ගොස් තම ඥාති මිත්‍රාදීන් සොයා ගෙන හෝ ආපසු පැමිණෙන බව සූත්‍ර ධර්මවල දැක්වෙනවා ඔවුන් ආපසු එන්නේ පින් බලාපොරොත්තුව ඔවුනට පින්පෙත් මදි. නිසයි ආපහු එන්නේ, නමුත් මෙලොව ජීවත් වන අය මියගිය පුද්ගලයා අමතක කර දමා පින්පෙත් අනුමොදන් කරවන්නේ නැතිව කකා බිබී කාලය ගත කරනවා නම් ඒ එන ප්‍රාණකාරයා නො සතුටු බවටත් පත් වෙනවා ධූමයක් පිටකරනවා තමන්ගේ නොමනාපය පළ කරනවා මෙම තත්වය මෙලොව ජීවත් වන අපගේ ජීවිතවලට සුදුසු නැහැ

දියුණුව අඩුවෙනවා සමගි අඹුසැමියන් දබර වෙනවා දරුවන් අතර භේද බින්නතා ඇති වෙනවා ප්‍රේම සබඳතා කඩා බිඳ වැටෙනවා බලාපොරොත්තු ඉටු වෙන්නේ නැහැ, මළගිය අයට පින් දෙන තුරු ම ඔවුන් එබඳු ආකාරයේ විපත්ති කරනවා

ගෙයි ඇතුලේ ඇවිදිනවා කාමරවල නිදාගන්නවා ගෙදර අයට ඉවු දේවල් රස උරා බොනවා. මේ විදියට ගේ ඇතුළට ඇවිත් නොයෙක් විදිහේ දේවල් කරනවා මේවා කරන්නේ තරහෙන් සමහර විට ගෙදර සිටින දුර්වල මානසික තත්වයන් ඇති කෙනාට ආවේශ වූ පසුව කියවන්නේ මියගිය ප්‍රාණකාරයාට අවශ්‍ය දේවල් පිළිබද අත්දැකිම් ඕනැ තරම් තියෙනවා.

ප්‍රශ්නයඃ

**ගෙදරට හෝ ඉඩමට අරක්ගෙන සිටින මළගිය ප්‍රාණකාරයන් ඉන් ඉවත් කරන ක්‍රම තිබෙනවාද?**

පිළිතුරඃ

සාමාන්‍යයෙන් ගේ දෙර කෙරෙහි හටගත් අධික තෘෂ්ණාව නිසාම මරණයට පත් වී ඒවායේ ම ජීවත් වන අවස්ථා තිබෙනවා ගෙවල්වලට බැල්ම හෙලන කෑම බීම දේවල් ඉඹ බලන නිවැසියන් යන එක ගමන් පිළිබද ව අවධානයෙන් සිටින ප්‍රේත වර්ග ඉන්නවා ප්‍රේත දිෂ්ටිය වැඩිපුර යොමු වන්නේ කුඩා දරුවන් සහ තරුණියන් කෙරෙහි යි, වැඩිවියට පත් වූ ආසන්න ම කාලවල මෙම තත්වය ඇති වෙයි නිතර බඩ පිපුම, උණ ගැනිම, ශරීරය කෘෂවීම හා අලස බව මුවින් නාසයෙන් නිතර සෙම් සොටු වැගිරිම, මුඛයෙන් ප්‍රේත ගද වහනය වීම, සිරුරේ අසුචි තැවැරි සිටීම වැනි ලක්‍ෂණ දක්නට ලැබීම ප්‍රේත බැල්ම ඇති බව කියා පාන ලකුණුයි. කිරි වමනය



කිරිම නිතර ඇඬීම සිහිනෙන් බිය වී අඬාගෙන අවදිවීම උණගතිය ශරීරය කෘෂ වීම විරූපි පෙනුමක් ඇති වීම යන ලකුණු සාමාන්‍යයෙන් දරුවන්හට ප්‍රේත බැල්ම ඇති ලකුණුයි

සාමාන්‍යයෙන් ප්‍රේත බැල්මක් ඇතැ යි සැක කරන නිවෙසක හැන්දෑ වරුවේ නොයිඳුල් බතක් පිස එය කෙසෙල් කොළයක ඔතා කුණු පොල් තෙල්වලින් දැල් වූ පහනක් ද ඇස්ස කැපු කුරුබා ගෙඩියක් ද පුලුටු කැබැල්ලක් ද ගෙයි මැද තබා දිෂ්ටි මන්ත්‍රයකින් ජපකොට තනිකර ගිය විට බතේ ඇඟිලි සලකුණ සටහන් වේ නම් තම සැකය තහවුරු කරගත හැකියි තත්කාල ශාස්ත්‍ර හා දේවාරූඪයෙන් කියන ලද පේන මගින්ද නිවැරැදිව දැනගත හැකියි

ප්‍රේත පිදේනිය මගින් ද ප්‍රේත දෝෂය ඉවත් කර දැමිය හැකියි එසේම ප්‍රේතයා බැද දැමීම ප්‍රේතාරූඪය වැනි යාතු කර්ම මගින් නිවෙස්වලට හා ඉඩම්වලට අරක් ගත් ප්‍රේත දෝෂ ඉවත් කර දැමිය හැකියි. මෙබදු යාතු කර්ම සඳහා භාවිත කරගනු ලබන විවිධ පුද පිළිවෙත් තිබෙනවා ඒවා කරන කට්ටඩි මහතුන් මේ පිළිබුදව හොඳින් දැන භාවිත කරනවා.

සමහර අය තම නිවසට හෝ ඉඩමට ප්‍රේත බැල්ම ඇතැයි යන කුහුළින් යුතුව නිතර නිතර දුක් විඳිනවා, හරක් මස් හෝ ඌරු මස් නිතර ගෙනෙන හා උයන පිහන නිවෙස්වලට ප්‍රේත බැල්ම නිතර වැටෙන නිසා ඒවා පිසීමෙන් වැළකීම යහපත් එසේම නිතර පිරිත් කියන නිවෙස්වලට එබඳු අසුබ බැල්මක් වැටෙන අවස්ථා අඩුයි නිවසේ ජීවත් වන පුද්ගලයන්ගේ චරණ ක්‍රියා පද්ධතිය ද මේ සදහා බලපානු ලබනවා.

නිවෙස් ඉදිකිරීමේ දී ඉතා විශිෂ්ට නැකත් යොදාගැනිමෙන් නිවසේ කටයුතු ඉක්මණින් ඉටුකර ගත හැකිවා මෙන්ම බොහෝ දෝෂ මග හරවා ගත හැකිය තම නිවසට ඇතැම් දෝෂ පවතී යැයි යන කුහුලින් ඇතැමුන් නිවෙස් ඉඩකඩම් විකුණන අවස්ථා තිබෙනවා එය සාවද්‍ය ක්‍රමයක් සෑම ගැටලුවකටම පිළිතුරක් තිබෙනවා එ නිසා යම් යම් යාතු කර්ම මගින් ඒවා දුරුකර ගත හැකිය.

එ නිසා නිවසියන්ගේ චිත්ත ධෛර්යයද යහපත් ක්‍රියාවන්හි නිරතවීමද දෝෂ දුරුකර ගැනීමට හේතු වෙනවා

ප්‍රේත දෝෂ ඉවත්කිරීම සඳහා යම් යම් කට්ටඩි මහතුන් භාවිතා කරන පුද පූජා වර්ග ඒ ඒ ප්‍රදේශ අනුව වෙනස් වෙනවා ඔවුන් තුල පවතින හැකියාවන්ද මේ සඳහා බලපෑම් කරනවා බොහෝ අවස්ථාවල දකින්නට ලැබෙන සුලබ දෙයක් වන්නේ ප්‍රේත දෝෂ ඉවත් කළ පසුවත් ඒවා පවතින බව පෙනී යාමයි. ප්‍රේතයන් ඒ ඒ අවස්ථාවල අරක්ගෙන සිටින්නේ එකම අරමුණකින් නොවේ සමහර අය තමාගේ කුස පිරෙන්න අහර කොටසක් ලැබුණු පසු ඉවත්ව යනවා. නමුත් ඇතැම් ප්‍රේත කොටස් එසේ ආහාර වේලකින් සෑනසී පිටව යාමට කැමැත්ත දක්වන්නේ නැත. ඒ නිසා ඔවුන් එළවීමට නොයෙක් ක්‍රියාමාර්ග ගැනීමට සිදුවෙනවා ප්‍රේතයන් බැඳීම එසේ කොට සාගරයේ තනිකර දැමීම, වැනි ක්‍රියාමාර්ග ගැනිමට සිඳුවන්නේ එබඳු අවස්ථාවලදිය. සමහර ප්‍රේතයන් එසේත් යන්නේ නැහැ කට්ටඬියා නොමග යවමින් එහෙ මෙහෙ පනිමින් අල්ලා ගැනිමට නොහැකිවන සේ ක්‍රියා කරනු ලබනවා මොවුන් ගැන සැලකිල්ලෙන් සිටිය යුතුය.

ප්‍රේත බැල්ම මගින් බොහෝ විට සිදුවන්නේ ජීවිත හානි වලට වඩා පිවත්වන අයගේ පවිත්‍ර ජීවිතය අවුල් වියවුල් කිරිමයි. කොපමණ හොඳින් නිවස හා පරිසරය පිරිසිදු කරනු ලැබුවත් ඉක්මනින් අපවිත්‍ර වෙනවා. ප්‍රේත බැල්ම ඇති ස්ථාන නිතර අඳුරු ස්භාව ගන්නවා අමුතු විදිහේ දුගදක් හමා එනවා.

**නොපෙනෙන ලෝකය නැමැති කෘතියේ පළවුණු ලිපියකි**